“ඔබ අතරින් කිසිවකු හෝ නින්දට වැටුණු විට ඔහුගේ හිස් කෙළවරෙහි ගැට තුනක් ෂෙයිතාන් ගැට ගසයි. ‘ඔබට දිගු රාත්රියක්, හොදින් නිදා ගන්න’

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ඔබ අතරින් කිසිවකු හෝ නින්දට වැටුණු විට ඔහුගේ හිස් කෙළවරෙහි ගැට තුනක් ෂෙයිතාන් ගැට ගසයි. ‘ඔබට දිගු රාත්රියක්, හොදින් නිදා ගන්න’ යැයි පවසමින් ෂෙයිතාන් සෑම ගැටයක් මතම ගැට ගසනු ඇත. නමුත් ඔහු අවදි වී උත්තරීතර අල්ලාහ්ව මෙනෙහි කරන විට ගැටයක් ලිහෙනු ඇත. පසුව ඔහු වුළූ ධෝවනය කළ විට තවත් ගැටයක් ලිහෙනු ඇත. පසුව ඔහු සලාත් ඉටු කළ විට ඔහුගේ
සියලු ගැට ලිහෙනු ඇත. පසුව ඔහු මනා මානසික සුවයෙන් යුතුව ධෛර්යමත්ව අවදිවනු ඇත. එසේ නොවේ නම් විකෘති අයහපත් මනසකින් යුතුව මැලිකමින් අවදිවනු ඇත.” [صحيح] [متفق عليه]

ෂෙයිතාන්ගේ තත්ත්වය පිළිබඳවත්, රාත්රි සලාතය සඳහා හෝ ෆජ්ර් සලාතය සඳහා අවදිවීමට අපේක්ෂා කරන මිනිසා සමග ඔහු කරන අරගලය පිළිබඳවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ දන්වා සිටියි. සැබැවින්ම දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයා නින්දට ගිය විට ඔහුගේ හිස් කෙළවරෙහි ගැට තුනක් ෂෙයිතාන් ගැට ගසයි. දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයා අවදි වී උත්තරීතර අල්ලාහ්ව මෙනෙහි කර, ෂෙයිතාන්ගේ කුකුසට පිළිතුරු නො දුන්නේ නම්, ගැටයක් ලිහෙනු ඇත. එසේම හෙතෙම වුළූ ගත්තේ නම්, තවත් ගැටයක් ලිහෙනු ඇත. එසේම නැගිට සලාත් ඉටු කළේ නම්, තුන්වන ගැටය ද ලිහෙනු ඇත. පසුව එම ගැට ලිහීමත් සමගම ඔහු අල්ලාහ්ට අවනත වීම සදහා ඔහුට ආශිර්වාද කළ දෑ ගැන සතුටට පත්ව මනා මානසික සුවයකින් යුතුව දිරියෙන් හා අල්ලාහ් ඔහුට පොරොන්දු වූ කුසල් හා සමාව ගැන සතුටු වෙමින් අවදිවනු ඇත. එසේ නොවුනු විටෙක, ෂෙයිතාන් ගැට ගසා ඇති ගැට හේතුවෙන් ඔහුගේ මනස කිලිටි තත්ත්වයට පත්වේ. සිත දුකට පත්වේ. යහපත් හා දැහැමි ක්රියාවන් කිරීමට මැළිකමක් ඇති වේ. මහා කාරුණිකයාණන්ට සමීපවීමෙන් ඔහුව දුරස් කරයි.

http://sunnah.global/hadeeth/si/show/3731